**කුඩා තේ වතු හා රබර් වතු යළි නඟා සිටුවීමේ ව්‍යාපෘතිය - 2017**

-------------------------------------------------------------------

කුඩා තේ වතු හා රබර් වතු යළි නඟා සිටුවීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල අතර 2016 අප්‍රේල් 26 දින එළඹි අංක 2000001447 දරණ මූල්‍යයන ගිවිසුමේ XI ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතිය ප්‍රදේශය තුළ කුඩා තේ වතු හා රබර් වතු හිමියන්ගේ වැඩි ඵලදායීත්වය, ලාභදායීත්වය සහ ප්‍රකෘතිමත් බවට ආර්ථික කටයුතු සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො.මිලියන 65.40 කට සමාන රු.මිලියන 8,502 ක් වන අතර ඉන් එ.ජ.ඩො මිලියන 25.76 කට සමාන රු.මිලියන 3,349.30 ක් සැපයීමට කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 අගෝස්තු 15 දින ආරම්භ කරන ලද අතර 2021 අප්‍රේල් 23 දිනට නිමකිරීමට අපේක්ෂිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකිම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට හා ව්‍යාපෘති විගණනය සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අන්තර්ජාතික අරමුදලේ මඟපෙන්වීම් වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලබන මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියෙහි වැඩිදියුණු කළ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණයදෙන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය මුදලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම්, මූල්‍ය ගිවිසුමේ නියම කරන ලද පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක ශේෂය සහ අවසාන ශේෂය, එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට කරන ලද ඌනපූර්ණයන් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන පිළියෙල කර තිබුණේද යන බව .

(එ) පෙර වර්ෂයේ දී මාගේ විගණන වාර්තාවෙහි සඳහන් කරන ලද ගැටළු සඳහා සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ.

(ඒ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර ඇති බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර් ජාතික අරමුදලේ මාර්ගෝපදේශවලට අනුකූලව 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක ශේෂය සහ අවසාන ශේෂය, එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට කරන ලද ඌනපූර්ණයන් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුව ඉදිරිපත් කර ඇති වියදම් වාර්තා කෙරෙහි සාධාරණව විශ්වාසය තැබිය හැකිව ප්‍රතිපූර්ණය සඳහා ඉල්ලුම් කර ඇති බව,

(ඉ) පෙර වර්ෂයේ දී මාගේ විගණන වාර්තාවෙහි සඳහන් කරන ලද ගැටළු සඳහා සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 2.2.1 නීතිරීති රෙගුලාසි වලට අනුකූල නොවීම්

--------------------------------------------

2016 මාර්තු 24 දිනැති අංක 1/2016 දරණ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 1.3 ඡේදය පරිදි ව්‍යාපෘතියක විදේශ අරමුදලින් මූල්‍යයණය වන කොටස ව්‍යාපෘතියේ මුළු වියදමින් සියයට 60 කට වඩා අඩු නොවේ නම් එම ව්‍යාපෘතිය විදේශ අරමුදල් ව්‍යාපෘතියක් වශයෙන් සලකා බැලේ. එසේ වුවත් මුළු වියදම වූ ඇ.ඩො. මිලියන 65.40 කින් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදලේ දායකත්වය සියයට 39 කට සීමා වී තිබුණද ව්‍යාපෘතිය විදේශ අරමුදල් ව්‍යාපෘතියක් වශයෙන් සලකා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

----------------------------------

## 3.1 අරමුදල් උපයෝජනය

--------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන සහ අරමුදල් භාවිතය පිළිබඳව සමාලෝචිත වර්ෂයේදී සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | අයවැය ඇස්තමේන්තුවල සමාලෝචිත වර්ෂය සඳහා වෙන්කළ මුදල් | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළදී | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල | 25.76 | 3,349.30 | 400.00 | 1.787 | 273.84 | 1.911 | 292.86 |
| සහභාගීත්ව බැංකු | 3.25 | 422.60 | - | - | - | - | - |
| ප්‍රතිලාභීන්ගේ දායකය | 3.61 | 469.20 | - | 0.009 | 1.44 | 0.009 | 1.44 |
| පුද්ගලික පාර්ශවයන් | 0.02 | 1.90 | - | - | - | - | - |
| ශ්‍රී ලංකා රජය | 32.76 | 4,259.00 | 900.00 | 0.185 | 28.41 | 0.236 | 36.27 |
| එකතුව | 65.40 | 8,502.00 | 1,300.00 | 1.981 | 303.69 | 2.156 | 330.57 |

අයවැය ඇස්තමේන්තුවල සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 400.00 ක් විදේශ මූල්‍යයන සංරචකය යටතේ වෙන්කර තිබූ නමුත්, ව්‍යාපෘතිය එහි කටයුතු සිදු කිරීමට සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 911 ක පිරිවැයකට ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම විශ්වාසදායි ආකාරයට පිළියෙල කර නොමැති බව පෙන්නුම් කෙරුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට හා කුඩා තේ වතු හිමියන් සංවර්ධනය කිරීමේ අධිකාරිය සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය ලබාදීමට සහ මූල්‍ය ආයතන 04 ක සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කරන ණය වැඩසටහන් මගින් මූල්‍ය පහසුකම් ලබාදීම සඳහා සංරචක 03 කින් ව්‍යාපෘතිය සමන්විත විය. ගාල්ල, මාතර, රත්නපුර, බදුල්ල, නුවර හා නුවරඑළිය දිස්ත්‍රික්කවල නැවත වගා කිරීමේ අරමුණු සඳහා සහ අම්පාර,මොණරාගල දිස්ත්‍රික්කවල කුඩා රබර් වතු හිමියන්ට නව වගා අරමුණු සඳහා සහයෝගය ලබා දීම සඳහා සහනාධාර ක්‍රම ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කෙරේ. ඉහත සඳහන් සංරචක 03 හි ප්‍රගතියට අදාළව පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සංරචක 03 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරිමට එකතුව රු. මිලියන 330.57 ක මුදලක් වැයකර තිබුණු අතර ඉන් රු.මිලියන 203 ක මුදලක් හෙවත් මුළු වියදමින් සියයට 61 ක් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කිරීමට වැය කර තිබුණි. සේවක පාරිශ්‍රමික සඳහා රු.මිලියන 59.3 ක මුදලක් හෙවත් මුළු පිරිවැයෙන් සියයට 18 ක් ඇතුළුව ව්‍යාපෘතියේ අධීක්ෂණ අරමුණ සඳහා ඉතිරි රු.මිලියන 127.57 ක මුදල හෙවත් මුළු පිරිවැයෙන් සියයට 38 ක් වැය කර තිබුණි.

(ආ) වාර්ෂික වැඩ සැලැස්ම අනුව කුඩා තේ වතු හිමියන් සංවර්ධනය කිරීමේ සංරචකය යටතේ කුඩා තේ වතු හිමියන් සඳහා වෙළෙඳපොළ විවිධාංගීකරණය කිරීම සහ වෙළෙඳපොළ ඉලක්ක කරගත් නිෂ්පාදන සහායක කටයුතු සිදු කිරීම සඳහා රු. මිලියන 671 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දී වෙන් කර තිබුණි. එහෙත් 2017 දෙසැම්බර් 31 දිනටත් එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.

(ඈ) කුඩා තේ වතු හිමියන්ට නව වගා අරමුණු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු. මිලියන 135.28 ක සහනාධාර ලබාදී තිබුණි.කෙසේ වුවද, රු.මිලියන 35.65 ක සහනාධාර මුදල් යටතේ වගා කළ ඉඩම් පිළිබඳව වාර්තා විගණනයට ලබා දී නොතිබුණි.

(ඇ) විගණනයට ලබා දී තිබුණු තොරතුරු අනුව නව වගා අරමුණු වෙනුවෙන් රබර් පැළ 300,000 ක් අම්පාර හා මොනරාගල දිස්ත්‍රික්කවල කුඩා වතු හිමියන් සඳහා ලබා දීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද රබර් පැළ 93,000 ක් පමණක් එම දිස්ත්‍රික්කවල කුඩා වතු හිමියන් සඳහා බෙදා හැර තිබුණි.

(ඉ) නව රබර් වගා අරමුණු සඳහා ඉඩම් නිදහස් කිරීම සඳහා අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 280 ක කැළෑ ඉඩම්වල සීමා නිර්ණය හා මැනුම් කිරීම සඳහා 2017 නොවැම්බර් 23 දින රු. මිලියන 1.75 ක මුදලක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ව්‍යාපෘතිය ගෙවා තිබුණි. කෙසේවුවද, ඒවායේ කටයුතු 2018 මැයි 31 දිනටත් ආරම්භ කර නොතිබුණි.

(ඊ) ව්‍යාපෘතියේ වැඩ සැලැස්ම අනුව ග්‍රාමීය මූල්‍ය සංරචකය යටතේ කුඩා තේ වතු හා රබර් වතු හිමියන් සඳහා ණය පහසුකම් ලබා දීම සඳහා රු. මිලියන 139.89 ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේවුවද, 2017 දෙසැම්බර් 31 දිනටත් අදාල සංරචකය යටතේ ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.